**ශීර්ෂය 118- කෘෂිකර්ම අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව.**

**1 කොටස**

**කෘෂිකර්ම අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 285 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.5,629,894,200 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.4,732,234,801 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.507,051,083 ක් හා රු.390,608,316 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 28 ක් හා සියයට 10 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 118 | 1,829,630,000 | 1,322,578,917 | 507,051,083 | 28 |
| 285 | 3,800,264,200 | 3,409,655,884 | 390,608,316 | 10 |
| **එකතුව** | **5,629,894,200** | **4,732,234,801** | **897,659,399** | **16** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් එකතුව රු.750,952,459 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබාගත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2013 දෙසැම්බර් 31 දිනට ලද ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිය/ |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | සමෘද්ධි කොමසාරිස් ජනරාල් | 25,741,000 | 25,741,000 | - |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | දිස්ත්‍රික් ලේකම් ගම්පහ | 510,000 | 396,977 | 113,023 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6,500,460 | 2,419,888 | 4,080,572 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 19,420,000 | 21,988,317 | (2,568,317) |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 410,300,000 | 50,697,976 | 359,602,024 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට | 98,997 | 98,977 | - |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 97,611,577 | 92,710,794 | 4,900,783 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පරිසර හා පුනර්ජණනිය බලශක්ති අමාත්‍යාංශය | 69,500 | 58,200 | 11,250 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම අමාත්‍යාංශය | 76,827,052 | 60,148,963 | 16,678,089 |
| **එකතුව** | | **637,078,586** | **254,261,162** | **382,817,424** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තු විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් සඳහා එකතුව රු.මිලියන 130 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 167.6 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 129 ක ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු. | රු. | රු. | |
| 20.03.02.18 | 130,000,000 | 167,655,907 | 37,655,907 | 129 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11801 | 8,500,000 | 8,267,805 | 4,800,000 | 8,686,155 | 55,000,000 | 34,322,781 |
| 28501 | 185,000,000 | 97,320,669 | 135,000,000 | 149,824,944 | 600,000,000 | 349,523,047 |

### 2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවකට අදාල වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 28502 | 416,000,000 | 413,984,762 | 416,000,000 | 424,160,945 | 70,000,000 | 17,155,847 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2013 | | 2012 | |
| | | (පාඩුව) කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | | රු. | රු. | රු. | රු. |
| 28502 | කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුම | (9,472,475) | 7,899,390 | 33,108,357 | 49,103,017 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.11,621,248 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 7002/0000/00/0325/0013/000 | 8,898,370 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 7002/0000/00/0081/0013/000 | 2,722,878 |
| එකතුව | | 11,621,248 |

**2.4.2 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.66,664,436 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 6000/0000/00/0015/0031/000 | 7,751,220 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0140/000 | 58,913,216 |
| එකතුව | | 66,664,436 |

2 කොටස

------------

එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

------------------------------------------------------

**1. ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 12 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 45 ත් සියයට 96 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 11801 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,028,947 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ ලැයිස්තුවේ ඇතුළත් රු.23,835 ක් වූ විවිධ ණය ගැතියන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

වී වගාව සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම වෙනුවෙන් රු.මිලියන 150 ක ප්‍රතිපාදන සළසා තිබුණද එම කාර්යයන් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂයන් කරනු ලැබේ.

(අ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන 95 ක් බාහිර ආයතන 20 ක් වෙත විධිමත් පරිදි පවරාදීමකින් තොරව ලබා දී තිබුණි.

(ආ) **වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

වෙනත් ආයතන 09 ක් සතු වාහන 19 ක් අමාත්‍යාංශය විසින් විධිමත් පවරා ගැනීමකින් තොරව භාවිතයට ගෙන තිබුණි.

## 1.6 කාර්යසාධනය

### ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන්වලින් සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත ප්‍රගතිය ලගා කර ගෙන නොතිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික්ක 07 ක හෙක්ටයාර 32,575 ක සෝයා බෝංචි වගා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් රු.මිලියන 132 ක ප්‍රතිපාදන සළසා තිබුණද ප්‍රගති වාර්තා අනුව රු.මිලියන 43.7 ක් පමණක් වැයකර හෙක්ටයාර 11,397 ක සෝයා බෝංචි වගාකර තිබුණි. අමාත්‍යාංශය මැදිහත් වීමෙන් සෝයා බෝංචි බීජ සහන මිලට ගොවීන්ට ලබාදී තිබුණු අතර සමහර සමාගම් විසින් ගොවීන්ට ලබාදුන් බීජ ප්‍රමිතියෙන් තොරවීම නිසා වගාකිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකිවී තිබුණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 2,814 ක බිම් ප්‍රමාණයක වගාකළ සෝයා බෝංචි බීජ

ගුණාත්මක බවින් අඩු බැවින් අපේක්ෂිත අස්වැන්න ලබාගෙන නොතිබුණු අතර අසාර්ථක වූ බීජ සඳහා ගොවීන්ට වන්දි ලබාදීමටද සමාගම් එකඟ වී තිබුණි. බීජ මිලදී ගැනීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් එක් සමාගමකට රු.18,012,500 ක් ගෙවා තිබුණු අතර එම සමාගම විසින් 2014 අගෝස්තු 08 දින වන විට වන්දි වශයෙන් රු.15,457,209 ක් ගොවීන්ට ගෙවා තිබුණි. තවදුරටත් එම සමාගම රු.11,076,611 ක් වන්දි වශයෙන් ගොවීන්ට ලබාදිය යුතුව පැවති බවද නිරීක්ෂණය විය.

(ආ) වියළි මිරිස් නිෂ්පාදනය සඳහා දිස්ත්‍රික්ක 15 ක හෙක්ටයාර 4,423.7 ක් මිරිස් වගාකර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 11.67 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මිරිස් වගා කිරීමේ ප්‍රගති වාර්තාව අනුව අනුරාධපුර, යාපනය හා මඩකළපුව දිස්ත්‍රික්කවල අනෙක් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව අඩු ප්‍රගතියක් ලගාකර ගෙන තිබුණි.

(ඇ) රත්නපුර, මොණරාගල හා මුලතිව් යන දිස්ත්‍රික්ක තුනෙහි හෙක්ටයාර 70 ක රතුළූණු වගාකිරීම සඳහා රු.මිලියන 10.94 ක ප්‍රතිපාදන සළසා තිබුණද සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු හා ගොවීන් තේරීම පමණක් සිදුකර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 3.521 ක් වැය කර තිබුණි. සත්‍ය බීජ සපයාගත නොහැකිවීම නිසා පුත්තලම දිස්ත්‍රික්කයේත්, ගොවීන් උනන්දු නොවීම නිසා මොණරාගල දිස්ත්‍රික්කයේත් රතුළූණු වගා නොකෙරුණු බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඈ) පරිසර හිතකාමී පාරම්පරික හෙළ ගොවිතැන සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.මිලියන 30 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර ඉන් දිස්ත්‍රික්ක 20 ක හෙක්ටයාර 8,874.6 ක් වගාකිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ වුවද භෞතික ප්‍රගතිය හෙක්ටයාර 4,262 ක් වූ අතර වියදම රු.මිලියන 20.6 ක් වී තිබුණි.

(ඉ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලොකුළූණු හා මුං ඇට වගා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන වශයෙන් පිළිවෙලින් රු.මිලියන 32.6 ක් හා රු.මිලියන 12.63 ක් සළසා තිබුණි. වගාව සඳහා පිළිවෙලින් රු.මිලියන 32.35 ක් හා රු.මිලියන 9.3 ක් වැයකර තිබුණත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. වර්ෂාව අධික වීම හා බීජ හිඟය නිසා අපේක්ෂිත ඉලක්ක ලගා කරගත නොහැකි වූ බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබුණි.

**1.7 අවිධිමත් ගනුදෙනු**

-------------------

වාණිජ ගොවිපොළ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.62,777,800 ක් වැය කර ප්‍රතිලාභීන් 450 ක් සඳහා කෘෂි යෙදවුම් ලබාදී තිබුණද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**1.8 පාඩු හා හානි**

-------------

මඩකලපුව දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 5,256.71 ක භූමි ප්‍රමාණයක අතිරේක භෝග වර්ග 06 ක් වගාකිරීම සඳහා රු.මිලියන 4.63 ක් වැය කර තිබුණු අතර මෙම වගාවන් ගංවතුරෙන් හානිවූ බව දක්වා තිබුණි.

**1.9 කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) **කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම**

------------------------------------------------------------

2012 පෙබරවාරි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2012 යල කන්නයේදී ඉහත සඳහන් ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක 4 ක නියමු ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික්ක 2 ක පමණක් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබු අතර එහි ප්‍රගතිය පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතුව තිබුණත්, එසේ වාර්තා කිරීමද කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ගොවීන් දිරිගැන්වීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර මසක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් වුවත්, එවැනි වැඩපිළිවලක් සකස් නොකර ගොවීන්ට බෙදාදීම සඳහා උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීමට 2012 හා 2013 වර්ෂවලදී පිළිවෙලින් රු.73,745,836 ක් හා රු.26,306,539 ක් වැයකර තිබුණි. එම උපකරණ හා ද්‍රව්‍යවලින් රු.9,368,140 ක් වටිනා උපකරණ හා ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද බෙදා හැර නොතිබුණු අතර, ඒවා අනුරාධපුර හා පොළොන්නරුව ගොවිජන සේවා මධ්‍යස්ථාන ගබඩාවල පැවතුණි. වටිනාකම රු.6,551,110 ක් වූ උපකරණ බෙදාහැරීම් පිළිබඳ තොරතුරුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii). ගොවීන් නිපදවන කාබනික පොහොර ප්‍රමාණය තහවුරු කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් නොකර නිෂ්පාදනය කළ කාබනික පොහොර කි.ග්‍රෑ. 1 කට රු.8.00 බැගින් රු.මිලියන 36.17 ක් 2012 වර්ෂයේද, අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ගොවීන් වෙත ගෙවා තිබුණි.

(ආ) **සහල් අපනයන කලාප පිහිටුවීම**

---------------------------------

සහල් අපනයනය ප්‍රචලිත කිරීම සඳහා සහල් අපනයන කලාප පිහිටුවීමට 2012 වර්ෂයේදී රු.මිලියන 25 ක ප්‍රතිපාදන සළසා තිබු අතර සහල් මෙ.ටො. 8,523 ක් නිෂ්පාදනය කර තිබුණි. ලාංකීය වී ප්‍රබේද සඳහා ජාත්‍යන්තර වෙළඳපොලේ පවතින අඩු ඉල්ලුම හා දේශීය සහල් නිෂ්පාදන වියදම වැඩිවීම හේතුවෙන් සහල් අපනයන කටයුතු සිදුකර නොතිබුණද, 2013 වර්ෂයේ දී ද රු.මිලියන 75 ක ප්‍රතිපාදන මේ සඳහා සළසා තිබුණි. රසායන ද්‍රව්‍ය හා පැරෂුට් තැටි මිලට ගැනීම, ක්ෂේත්‍ර පරීක්ෂණ, පර්යේෂණ, තාක්ෂණ ප්‍රචාරණ ආදී කටයුතු සඳහා පමණක් රු.මිලියන 2.98 ක් වැයකර තිබු අතර 2013/14 මහකන්නයේදී වී වගාව ආරම්භ කරන බව දක්වා තිබුණද එහි ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.10 **මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 126 | 113 | 13 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 202 | 159 | 43 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 122 | 65 | 57 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 04 | - | 04 |
| | **එකතුව** | **455** | **345** | **114** | **04** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 114 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| ද්විතියික මට්ටම | 01 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 2010 දෙසැම්බර් 14 දින සිට 2014 අගෝස්තු 31 දින දක්වා |
| එම | 01 | ස්වේච්ඡා බලකායේ සක්‍රීය සේවය | 2008 සැප්තැම්බර් 24 දින සිට 2014 අගෝස්තු 31 දින දක්වා |

(ඇ) **වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

ටවර්හෝල් පදනමින්, දක්ෂිණ සංවර්ධන අධිකාරියෙන් හා මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් ලබන රියදුරන් 03 ක් 2010 වර්ෂයේ සිට 2014 අගෝස්තු 31 දක්වාම අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවාගෙන තිබුණි.

## 2. ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 14 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ

සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විගණන විමසුම්වලට පිළිතුරුදීම

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 03 කට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 25 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම, නිසි අවස්ථාවලදී වැඩ ආරම්භ කර කල් ඇතිව අග්‍රිම මුදල් ලබාගෙන ගෙවීම් නොකිරීම සහ අපරීක්ෂාකාරීව ප්‍රතිපාදන සළසා ගැනීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19 ත් සියයට 53 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා එකතුව රු.1,045,689 ක බැදීම්වලට එළඹ තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

2014 අප්‍රේල් 30 දින වන විට දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.1,024,796 ක් වී තිබුණි.

**(ඈ) ආදායම් ගිණුම්**

දෙපාර්තමේන්තුව විසින් 20.03.02.18 දරන ආදායම් සංකේතයට අදාල ආදායම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී රැස්කරන ලද රු.167,655,907 ක මුළු ශුද්ධ ආදායම සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාල, එහෙත් පසුගිය වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල සහ ඒකකවලින් ප්‍රධාන කාර්යාලයට අවස්ථා 24 කදී එවා තිබුණු 3,115,080 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමෙන් අත්හැර තිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 28501 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු

ශේෂවල එකතුව රු.18,701,065 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ii)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සේවකයන් දෙදෙනෙකුට ලබාදී තිබුණු එකතුව රු.300,205 ක්වූ දේපල ණය ශේෂයට අදාල ඉඩමේ ඔප්පුව දෙපාර්තමේන්තුව භාරයේ නොතිබුණි.

**(ඊ)** **වාණිජ අත්තිකාරම් ගිණුම**

**----------------------------**

විෂය අංක 28502 දරන කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා අලෙවිය අත්තිකාරම් ගිණුම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයන් ප්‍රකාශ කර තිබුණි.

(ii) අත්තිකාරම් ගිණුමට අදාල අයවිම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.919,036 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 22 සිට වසර 31 දක්වා කාල පරාසයකට අයත් නිරවුල් නොකළ ණය හිමි ශේෂවල වටිනාකම රු.515,736 ක් වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය විය.

* සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ අතැති තොග යටතේ දැක්වෙන රු.1,109,463 ක පාරිභෝගික වී තොගයේ වටිනාකමට, 1999 වර්ෂයට පෙර සිට පැවත එන රු.19,344 ක පාරිභෝගික වී ඌනතාවයේ අගය ද ඇතුළත් කර තිබුණි. මේ නිසා තොගයේ වටිනාකම වැඩියෙන් දක්වා තිබිම නිසා ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

* පිදුරුතලාගල රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලෙහි, 2013 දෙසැම්බර් 31 දිනට රු.2,240,606 ක්වූ වැඩෙන වගාවෙහි අගය රු.655,206 ක් වැඩියෙන් රු.2,895,812 ක් ලෙස දක්වා තිබුණි.

* හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කරනු ලබන ට්‍රැක්ටර් හා ට්‍රේලර්වල වර්ෂයට අදාල රු.5,549,995 ක ක්ෂය ප්‍රමාණය රු.5,453,015 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකම රු.96,980 ක් අඩුවෙන් අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබුණි.

(v) අත්තිකාරම් කාර්යයට අදාල මෙහෙයුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අත්තිකාරම් ගිණුම යටතේ ක්‍රියාත්මක වන ගොවිපල 19 හි වගා කටයුතු සඳහා යොදාගත හැකි ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1,000 ක් වුවද ඉන් 2012/2013 මහ කන්නයේදී හෙක්ටයාර 361.5 හෙවත් සියයට 36 ක් ද, 2013 යල කන්නයේදී හෙක්ටයාර 435.5 ක් හෙවත් සියයට 43 ක් ද වගා කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.
- සමාලෝචිත වර්ෂයේදී එක් එක් ගොවිපල ලබා තිබුණු ලාභ හා පාඩු ඉකුත් වසර 04 සමඟ සැසඳීමේදී ගොවිපල දෙකක් එම මුළු කාල පරිච්ඡේදයටම පාඩු ලබා තිබුණි. එක් ගොවිපලක් වසර 03 ක් අඛන්ඩව පාඩු ලබා තිබුණු අතර, තවත් එක් ගොවිපලක් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී පාඩු ලබා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගොවිපල | | ලබා ඇති ලාභය /(පාඩුව) | | | | |
|---|---|---|---|---|---|---|
| | | **2013** | **2012** | **2011** | **2010** | **2009** |
| | | රු. | රු. | ර. | රු. | රු. |
| (i) | අලුත්තරම | (15,532,215) | (6,201,412) | 8,208,945 | 2,114,171 | 12,349,061 |
| (ii) | බටඅත | (6,467,064) | (22,298,516) | (16,984,214) | (11,259,851) | (17,743,539) |
| (iii) | මිද්දෙණිය | (6,752,696) | (10,931,573) | (7,443,305) | (7,359,607) | (2,161,240) |
| (iv) | සීතාඑළිය | (1,938,689) | (2,645,657) | (14,725,873) | 4,149,887 | (10,660,468) |

- 2013 නොවැම්බර් 22 දින මහඉලුප්පල්ලම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ වී ගබඩාවේ තොග පරීක්ෂාවේදී වී වර්ග 9 ක වී බුසල් 65 ක තොග ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර එම ඌනතාවයේ වටිනාකම ගණනය කර නොතිබුණි.

- මහඉලුප්පල්ලම හා පොලොන්නරුව රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ පොල් වගාවේ ඵලදාව පහළ මට්ටමක පැවති අතර, පසුගිය වසර පහක කාලය තුළ එක් ගසක සාමාන්‍ය වාර්ෂික ඵලදාව පිළිවෙලින් ගෙඩි 08 සිට ගෙඩි 12 ක් හා ගෙඩි 08 සිට 24 දක්වා වූ පරාසවල ප්‍රමාණයන් ගෙන තිබුණි.
- මහඉලුපුපල්ලම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ 2012/2013 මහ කන්නයේ සහ 2013 යල කන්නයේ අතිරේක ආහාර බෝග වර්ග 30 ක් වගාකිරීම සඳහා රු.11,407,493 ක් වැය කර රු.1,208,482 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී රු.10,199,011 ක පාඩුවක් සිදුවී තිබුණි.
- මහඉලුපුපල්ලම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ භාවිතයෙන් ඉවත් කර වසර 10 ක් පමණ වන ක්ටර් 06 ක් සුදුසු පරිදි කටයුතු නොකර ගොවිපලේ වාහන අංගනයේ රඳවාගෙන තිබුණි.
- පොළොන්නරුව රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලයේ විවිධ තනතුරු 18 ක පුරප්පාඩු පැවතුණි.
- ගොවිපලේ භාවිතයෙන් ඉවත්කර මාස 01 සිට වසර 15 අතර කාලපරාශයක් ගතවී ඇති ට්‍රැක්ටර් රථ 13 ක් සහ භාවිතයෙන් ඉවත් කර වසර 07 සිට වසර 20 අතර කාලපරාශයක් ගතවී ඇති යන්ත්‍ර උපකරණ 04 ක් ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර අපහරණය කිරීමට හෝ කටයුතු නොකර කාර්යාල පරිශ්‍රයේ හා ගබඩාවේ රඳවාගෙන තිබුණි.

**(උ) ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්**
**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම් 04 කට අදාල අනුමත නොකළ සමුච්චිත කාරක පාඩුවල එකතුව රු.65,654,747 ක් වී තිබුණි.

(ii) ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුමකට අදාල වසර 14 සිට වසර 33 අතර කාල පරාසයක් ගතවී තිබුණු රු.6,916,657 ක අය වියයුතු ශේෂද, වසර 15 සිට වසර 25 අතර කාලපරාසයක් ගතවී තිබුණු රු.5,688,982 ක

පියවිය යුතු ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට හෝ පියවිමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

වත්කම් සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) පහත වර්ග කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **වත්කම් වර්ගය** | | **ඒකක ගණන** | **නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය** | |
|---|---|---|---|---|
| | | | **වසර 1 ට වැඩි 3 ට අඩු** | **වසර 3 ට වැඩි** |
| (i) | ඉඩම් (හෙක්ටයාර්) | 116.8 | - | 116.8 |
| (ii) | ගොඩනැගිලි | 63 | 02 | 61 |
| (iii) | මෝටර් වාහන | 125 | 15 | 110 |
| (iv) | යන්ත්‍ර සූත්‍ර | 935 | 173 | 762 |
| (v) | වෙනත් වත්කම් | 502 | 304 | 198 |

(ii) අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ භාවිතයෙන් ඉවත් කර වසර 04 සිට වසර 24 අතර කාලපරාසයක් ගතවී තිබුණු විවිධ වර්ගවල වාහන 15 ක්, වසර 15 සිට වසර 34 අතර කාලපරාසයක් ගතවී තිබුණු විවිධ වර්ගවල වාහන අමතර කොටස් විෂයයන් 05 කට අයත් ඒකක 6 ක් සහ වසර 01 සිට වසර 34 අතර කාලපරාසයක් ගතවී තිබුණු විවිධ වත්කම් විෂයයන් 06 කට අයත් ඒකක 22 ක් සුදුසු කටයුතු නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(iii) අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට අයත් අංක 02 දරන සංචාරක නිවාසය දැඩි ලෙස අබලන්ව පැවති අතර වසර 10 කට අධික කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.

(iv) සමාජ ආර්ථික සැළසුම් මධ්‍යස්ථානයට අයත් ඩිෆෙන්ඩර් ජීප් රථයක් 2008 සැප්තැම්බර් 08 දින සිට අලුත්වැඩියා නොකර ඉංජිනේරු අංශයේ රඳවා තිබුණු නමුත් ඒ සඳහා රු.331,050 ක් වටිනා අමතර කොටස් අලුත්වැඩියා කටයුතු සඳහා මිලදීගෙන ගබඩා කර තිබුණි.

(v) සමාජ ආර්ථික සැළසුම් මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගත නොහැකි අබලන් තත්ත්වයේ පැවති ගබඩා භාණ්ඩ විෂයයන් 10 කට අයත් භාණ්ඩ ඒකක 38 ක් සුදුසු කටයුතු කර අපහරණය නොකර වසර 02 සිට වසර 05 දක්වා කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(vi) වවුනියාව කෘෂිකර්ම උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය භාවිතයෙන් ඉවත් කර මාස 08 සිට වසර 10 අතර කාලපරාසයක් ගතවී තිබුණු කිලිනොච්චිය ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට අයත් වාහන 03 ක්, යතුරු පැදි 02 ක් සහ විවිධ වර්ගවල ගබඩා විෂයයන් 07 කට අදාල භාණ්ඩ ඒකක 09 ක් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කිසිවක් නොකර පර්යේෂණ මධ්‍යස්ථානයේ රඳවා තිබුණි.

(vii) වවුනියාව කෘෂිකර්ම උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය භාවිතයෙන් ඉවත් කර මාස 08 සිට වසර 05 දක්වා කාලපරාසයක් ගතවී තිබුණු වවුනියාව කෘෂිකර්ම උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් විෂයයන් 04 කට අයත් භාණ්ඩ ඒකක 72 ක් සුදුසු කටයුතු කර අපහරණය නොකර මධ්‍යස්ථානයේ රඳවා තිබුණි.

(viii) අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලයට අයත් මිට්ෂුබිසි වර්ගයේ ජීප් රථයක් 2012 සැප්තැම්බර් 13 දින සිට ධාවනයෙන් ඉවත් කර වාහන අංගනයේ රඳවාගෙන තිබුණු අතර, වාහනයේ අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් ඇස්තමේන්තු පිළියෙල කර හෝ ඒ සම්බන්ධ වෙනත් කටයුතු කිසිවක් ආරම්භ කර හෝ නොතිබුණි.

(ix) අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලය භාවිතයෙන් ඉවත් කර වසර 01 සිට වසර 10 අතර කාලපරාසයක් ගතවී තිබුණු උපකරණ විෂයයන් 13 කට අයත් භාණ්ඩ ඒකක 17 ක් ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර අපහරණය කිරීමට හෝ කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි.

(x) අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානයේ භාවිතයෙන් ඉවත් කර වසර 04 සිට වසර 10 අතර කාලපරාසයක් ගතවී තිබුණු යතුරු පැදි 03 ක් සහ ගබඩා විෂයයන් 10 කට අයත් යන්ත්‍ර සහ උපකරණ ඒකක 19 ක් ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගෙන අපහරණය කිරීමට හෝ කටයුතු නොකර ගබඩාවල රඳවා තිබුණි.

(xi) පොළොන්නරුව කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය භාවිතයෙන් ඉවත් කර වසර 01 සිට වසර 15 අතර කාලපරාසයක් ගතවී තිබුණු විවිධ ගබඩා විෂයයන් 20 කට අයත් භාණ්ඩ ඒකක 43 ක් අපහරණය නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(xii) වවුනියාව කෘෂිකර්ම විද්‍යාලයට අයත් රෝද 4 ට්‍රැක්ටරයක් හා වෙනත් උපකරණ විෂයයන් 04 කට අයත් ඒකක 64 ක් භාවිතයෙන් ඉවත් කර වසර 01 සිට වසර 03 දක්වා කාලයක් ගතවී තිබුණත්, අපහරණය නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(xiii) බෝඹුවල ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ භාවිතයෙන් ඉවත් කර වසර 08 සිට වසර 17 අතර කාලපරාසයකට අයත් විෂයයන් 11 කට අයත් ගබඩා භාණ්ඩ ඒකක 28 ක් සුදුසු කටයුතු නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(xiv) ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ භාවිතයෙන් ඉවත් කර වසර 01 සිට වසර 18 ක කාලපරාසයක් ගතවී ඇති වාහන 03 ක් සහ යතුරු පැදි 03 ක් සම්බන්ධයෙන් සුදුසු කටයුතු නොකර වාහන අංගනවල හා ගබඩාවල රඳවා තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**-----------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස පෞද්ගලික පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අතර එම වත්කම්වල වටිනාකම සහ ඒවා බාහිර පාර්ශවයන් පරිහරණය කළ කාලය ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| (i) | ඉඩම් (හෙක්ටයාර) | 3.5 |
| (ii) | ගොඩනැගිලි | 07 |

## 2.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 880 | මහඉලුප්පල්ලම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) කාර්යාලයේ මුදල් හා තොග සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් ඇප තබා නොතිබුණි. |
| (ආ) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වවුනියාව සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයේ, වවුනියාව කෘෂිකර්ම උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානයේ සහ බෝඹුවල ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |

(ඇ) **වෙනත් චක්‍රලේඛ**

**-------------------**

| | | |
|---|---|---|
| (i) | 2003 මැයි 12 දිනැති අංක 2003/01 දරන කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය | බෝඹුවල ප්‍රාදේශිය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට අයත් රජයේ නිවාස 07 ක් අළුත්වැඩියා නොකර 2004 වර්ෂයේ සිට ආර්ථික ගෙවල් කුලී අයකර තිබුණි. |
| (ii) | 2010 සැප්තැම්බර් 23 දිනැති අංක 08/2010 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | (i) අගුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ තොරතුරු ලේඛනයක් පවත්වා නොතිබුණි.<br><br>(ii) වවුනියාව කෘෂිකර්ම උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානයේ, අස්වැන්න නෙලීමේ කටයුතුවලදී ක්ෂේත්‍ර තුණ්ඩු භාවිතා කර නොතිබුණු අතර එලදා ලේඛනයක් හා පර්යේෂණ තොරතුරු ලේඛනයක් පවත්වා නොතිබුණි.<br><br>(iii) අගුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයේ අස්වැන්න නෙලීමේ කටයුතුවලදී ක්ෂේත්‍ර තුණ්ඩු භාවිතා කර නොතිබුණි.<br><br>(iv) අගුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයේ, මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනයේ සහ අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානයේ ගස් පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| | (v) මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සහ ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණ තොරතුරු ලේඛන පවත්වා නොතිබුණි. |
| (iii) 2012 මාර්තු 23 දිනැති අංක ප/6/3/4/4 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහඉලුප්පල්ලම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ පැවති රු.163,557 ක කල්ඉකුත් වූ කෘෂි රසායනික ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

## 2.6 කාර්යසාධනය

----------------

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

--------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** බෝඹුවල ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් විවිධ කාර්යයන් 04 ක් වෙනුවෙන් රු.3,255,000 ක මූල්‍ය ප්‍රතිපාදන සළසාගෙන තිබුණද, එම ප්‍රතිපාදන 2013 දෙසැම්බර් 31 වන විටද උපයෝජනය කර නොතිබුණි.

**(ii)** අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාල අදාලව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත වටිනාකම රු.85,000 ක් වූ කාර්යයන් 03 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

**(iii)** 2003 වර්ෂයෙන් පසු දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලය විසින් අත්හැර දමා තිබුණි.

**(iv)** මහඉලුප්පල්ලම නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) කාර්යාලයට අයත් බීජ නිෂ්පාදන ගොවිපලේ වර්ග මීටර 90 පොලිතින් ගෘහ 05 ක් ඉදිකිරීම සඳහා රු.909,918 ක් වටිනා ද්‍රව්‍ය මිලදීගෙන තිබුණද, ඉදිකිරීම් නිම කර නොතිබුණි.

**(v)** බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මේ ඇතුළත් කාර්යයන් 03 ක් සඳහා රු.7,950,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් 2013 දෙසැම්බර් 31 දින වන විට රු.4,824,088 ක් පමණක් වැයකර තිබුණු බැවින් රු.3,125,912 ක් හෙවත් ප්‍රතිපාදිත මුදලින් සියයට 39 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) **වගාවන්වල ඵලදාව අඩුවීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම විද්‍යාලවල හා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානවල කර තිබුණු වගාවන් හි ඵලදාව අඩුවූ අවස්ථාවන් නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) පහත සඳහන් කෘෂිකර්ම විද්‍යාලවල හා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානවල වගාකර තිබුණු පොල් ගස් 1,063 කින් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ලබා ගෙන තිබුණු ඵලදාවන් අනුව එක් පොල් ගසකින් වාර්ෂික ඵලදාව පොල් ගෙඩි 02 සිට 93 දක්වා පරාසයක ප්‍රමාණයක් වූ අඩු ඵලදාවක් ලබා ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| **කෘෂිකර්ම විද්‍යාලය/ සංවර්ධන හා පරියේෂණ මධ්‍යස්ථානය** | **පොල් ගස් ගණන** | **2008-2013 කාල පරිච්ඡේදයේදී එක් පොල් ගසක ඵලදාව** |
|---|---|---|
| | | **පොල් ගෙඩි ගණන** |
| වවුනියාව කෘෂිකර්ම විද්‍යාලය | 89 | 23 - 51 |
| බෝඹුවල ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 70 | 18 - 45 |
| අගුණකොලපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 126 | 61 - 93 |
| අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය | 531 | 02 - 16 |
| අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලය | 140 | 19 - 61 |
| අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය | 107 | 23 - 39 |
| **එකතුව** | **1,063** | |

(ii) පහත සඳහන් කෘෂිකර්ම විද්‍යාවල හා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානවල වගාකර තිබුණු අඹ ගස් 109 ක ඵලදාව 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ එක් අඹ ගසක වාර්ෂික ඵලදාව කිලෝ ග්‍රෑම් 0.5 සිට කිලෝ ග්‍රෑම් 25 අතර පරාසයක ප්‍රමාණයක් වූ අඩු ඵලදාවක් ලබා තිබුණි.

| කෘෂිකර්ම විද්‍යාලය/ සංවර්ධන හා පරියේෂණ මධ්‍යස්ථානය | අඹ ගස් ගණන | 2008-2013 කාල පරිච්ඡේදයේදී එක් අඹ ගසක ඵලදාව |
|---|---|---|
| | | කිලෝ ග්‍රෑම් |
| වවුනියාව කෘෂිකර්ම විද්‍යාලය | 60 | 0.5 – 20.0 |
| අගුණකොලපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය | 13 | 10 - 24 |
| අනුරාධපුර ගොවිපල යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය | 36 | 10 - 25 |
| **එකතුව** | **109** | |

(iii) වවුනියාව කෘෂිකර්ම විද්‍යාලයේ කජු ගස් 48 කින් පමණ සමන්විත විද්‍යාල භූමියේ කජු වගාව කප්පාදු කර නොතිබුණු අතර 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය අතර කාලය තුළ ගසක සාමාන්‍ය වාර්ෂික ඵලදාව ග්‍රෑම් 60 සිට ග්‍රෑම් 390 දක්වා පරාසයක ප්‍රමාණයක් වූ බැවින් කජු ඵලදාව පහළ මට්ටමක පැවතුණි

(iv) අගුණකොලපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2012/2013 මහ කන්නයේ අක්කර 18.25 ක වී වගාවෙන් වී බුසල් 817.5 ක අඩු අස්වැන්නක් ලැබී තිබුණු අතර, ඒ හේතුවෙන් රු.28,184 ක අලාභයක් සිදුවී තිබුණි.

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළයුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | එකතුව |
|---|---|---|---|---|
| | **මාස 06** ට වැඩි **වර්ෂ 01** ට අඩු | **වර්ෂ 01** ට වැඩි **වර්ෂ 03** ට අඩු | **වර්ෂ 03** ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| (i) උපලබ්ධි නොවූ තැන්පතු | 222,553 | 14,489 | - | 237,042 |
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 560,886 | 332,465 | - | 893,351 |
| (iii) හඳුනා නොගත් හර | 634,446 | 145,064 | 249,345 | 1,028,855 |
| (iv) හඳුනා නොගත් බැර | 234,972 | 362,988 | 27,207 | 625,167 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ ඉකුත් වූ බැංකු ගිණුම් 10 කට අදාල එකතුව රු.893,351 ක් වටිනා චෙක්පත් 90 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 07 කට අදාලව අවස්ථා 67 ක දී බැංකු ගිණුම්වලට හරවී තිබුණු මාස 06 ඉක්මවූ හඳුනානොගත් ශේෂ එකතුව රු.1,028,854 ක් වී තිබුණි.

(ඇ) බැංකු ගිණුම් 07 කට අදාලව අවස්ථා 112 කදී බැංකු ගිණුම්වලට බැරවී තිබුණු මාස 06 ඉක්මවූ හඳුනානොගත් ලැබීම්වල එකතුව රු.625,167 ක් වී තිබුණි.

(ඇ) බැංකු ගිණුම් 9 ක අවස්ථා 26 කදී එකතුව රු.237,042 ක් බැංකුවේ තැන්පත් කර මාස 06 ක් ඉක්මවා තිබුණත් එම තැන්පතු බැංකු ගිණුම්වලට බැර වී නොතිබුණි. එම තැන්පතු පිළිබඳව දෙපාර්තමේන්තුව සොයා බලා සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.8 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයේ සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා භාවිතා කර තිබුණු රු.67,200 ක් වටිනා ඇඟිලි සළකුණු යන්ත්‍රය 2012 ජූනි 28 දින ගින්නකින් විනාශවී තිබුණි.

**(ආ)** අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයට අයත් ජීප් රථයක් 2009 අගෝස්තු 19 දින අලුත්වැඩියා කටයුතු සඳහා බාහිර ආයතනයකට භාරදී තිබුණු අතර, එහිදී සිදුවී ඇති බවට හඳුනාගෙන තිබුණු රු.183,753 ක අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

**(ඇ)** අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ කල් ඉකුත් වී තිබුණු වටිනාකම රු.79,310 ක් වූ වර්ග 17 කට අයත් කෘෂි රසායන ද්‍රව්‍ය ඒකක 144 ක් හා කල් ඉකුත්වීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි 2006 වර්ෂයේ සිට පැවැත එන බෝග වර්ග 04 කට අයත් බීජ කිලෝ ග්‍රෑම් 62 ක් ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

**(ඈ)** අනුරාධපුර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයේ අනාවරණය කර ගෙන තිබුණු රු.17,948 ක තොග ඌනතාවය.

**(ඉ)** අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානයට අයත් රෝද හතරේ ට්‍රැක්ටරයක උපාංග කොටසකට 2006 මැයි 15 දින හානියට පත්වීම නිසා ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර, ඊට අදාල පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි

**(ඊ)** බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ කැබ් රථයකට 2012 අප්‍රේල් 25 දින ලොරි රථයක් ගැටීමෙන් රු.272,420 ක අලාභයක් සිදුවී තිබුණි.

**(උ)** කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ 1977 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 11 කදී සිදුවී තිබුණු අලාභවල වටිනාකම රු.5,161,547 ක් වී තිබුණි.

**(ඌ)** පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයට අනුබද්ධ කෘෂිකර්ම උපදේශක කාර්යාල 07 කට සහ වෙනත් ආයතන 02 කට අදාලව 1998 සහ 2011 වර්ෂවලදී සිදුවී ඇති අලාභහානි 10 ක වටිනාකම රු.186,859 ක් වි තිබුණි.

## 2.9 කළමනාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මහ කන්නයේ වගා කරන ඉඩම්වලින් හෙක්ටයාර් 12 ක් පමණ ප්‍රමාණවත් ජල සම්පාදනයක් නොමැති බැවින් යල කන්නයේදී වගා කිරීමට නොහැකි වී තිබුණු අතර, මධ්‍යස්ථානයට අයත් ඉඩමට ජලය සපයන වාරි ඇළෙහි කිලෝමීටර් 02 ක පමණ කොටසක් හා මධ්‍යස්ථාන භූමිය තුළ ඇළවේලිවල කිලෝමීටර් 05 ක පමණ කොටසක් ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. එමෙන්ම වගා කටයුතු සඳහා විධිමත් ජල කළමනාකරණයක් පවත්වාගෙන යාමට අවශ්‍ය කිලෝමීටර 07 ක පමණ නව ඇළවල් ද සකස් කර නොතිබුණි.

(ආ) අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට අයත් රජයේ නිවාස 18 ක් දිගුකලක් අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් ඒවායේ වහල, සිවිලිම, අගුපිල්, කාණු පද්ධති, ගෙබිම, දොර ජනෙල්, වැසිකිලි , ජලනල හා විදුලි පද්ධති අබලන්ව පැවතුණි.

(ඇ) අනුරාධපුර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාල බල ප්‍රදේශයේ ක්‍රියාත්මකවන කෘෂිකර්ම උපදේශක කාර්යාල 05 ක කෘෂිකාර්මික තොරතුරු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා තාක්ෂණ උපකරණ සපයා තිබුණද එම කෘෂිකාර්මික තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණු අතර, එම උපකරණවල වටිනාකමද විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) අනුරාධපුර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයට අයත් රජයේ නිවාස 10 ක් අලුත්වැඩියා කර නොතිබුණු අතර ඉන් නිවාස 04 ක් දැඩි ලෙස අබලන් වී තිබුණි.

(ඉ) අනුරාධපුර කෘෂිකර්ම විද්‍යාලය වටා ඇති අඩි 3,400 ක් පමණ වන ආරක්ෂිත වැට අලුත්වැඩියා කිරීමට අඩි 6 උස කම්බි දැල් ආවරණ දික් අඩි 650 ක් සහ විවිධ ප්‍රමාණවල යකඩ බට 70 ක් 2010 නොවැම්බර් 29 දින මිළදීගෙන තිබුණද, වැට අලුත්වැඩියා නොකර එම භාණ්ඩ ගබඩාවේ රඳවා තිබුණු අතර ඒවායේ වටිනාකමද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) අනුරාධපුර ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානයේ කාර්යාල ගොඩනැගිල්ල, ක්‍රියාකාරි නඩත්තු අංශයේ සහ වැඩපොල ගොඩනැගිලි, රජයේ නිවාස 34 ක්, ආරක්ෂිත වැට සහ අභ්‍යන්තර මාර්ග පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කර නොතිබුණි.

(උ) පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයේ ක්‍රියාත්මක කරන ලද 1997 යල, 1997/1998 මහ, 1998 යල, 1998/1999 මහ හා 1999 යල කන්නවලදී "වී අස්වනු වැඩි කිරීමේ විශේෂ ආදර්ශ යාය හා ණය පදනම මත අමිශ්‍ර පොහොර ලබාදීමේ" යාය වැඩසටහන් සඳහා ලංකා පොහොර සංස්ථාව විසින් ලබාදුන් පොහොර වෙනුවෙන් රු.1,010,859 ක මුදලක් ලංකා පොහොර සංස්ථාවට ගෙවිය යුතුව පැවතුණි. මෙම ණය මුදල් සම්බන්ධයෙන් දැනට සේවයේ යෙදී සිටින, විශ්‍රාම ගිය සහ වැඩ තහනමට ලක්ව ඇති නිලධාරින් 11 දෙනෙකු වගකිව යුතු අය ලෙස හඳුනාගෙන තිබුණද ඒ පිළිබඳ වෙනත් කටයුතු කිසිවක් කර නොතිබුණි.

(ඌ) පොළොන්නරුව කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයට අයත් රජයේ නිවාස 16 ක් අලුත්වැඩියා කර නොතිබුණු අතර ඉන් නිවාස 04 ක් දැඩි ලෙස අබලන් වී තිබුණි.

(එ) පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) කාර්යාලයට අයත් අංක 12 දරන රජයේ නිවාසයේ පදිංචිකරුවෙකුගෙන් 2009 ජනවාරි සිට 2012 ජූලි තෙක් කාලයට අදාල රු.55,800 ක හිඟ නිවාස කුලී අයකර නොතිබුණි. එමෙන්ම එම නිවාසයේ පදිංචිකරුගෙන් 2012 අගෝස්තු සිට 2013 නොවැම්බර් තෙක් කාලයට අදාල කුලී මුදල්ද අයකර නොතිබුණු අතර, එම කාලයට අයත් කුලී ප්‍රමාණය ගණනය කිරීමද කර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 675 | 516 | 159 |
| (ii) | තෘතියික මට්ටම | 249 | 88 | 161 |
| (iii) | ද්විතියික මට්ටම | 2,843 | 2,028 | 815 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 3,716 | 2,957 | 759 |
| (v) | වෙනත් (කොන්ත්‍රාත්) | 2,876 | 2,876 | - |
| | එකතුව | 10,359 | 8,465 | 1,894 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පැවති පුරප්පාඩු තනතුරු 1,894 න් 320 ක්ම මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරුවලින් සංයුක්ත වී පැවතුණි.